# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,553 — 1965 නොවැම්බර් 11 වැනි බ්‍රහස්පතින්ද— 1965.11.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1965 අංක 413**

අ.ආ.කා. අංකය: සි. 146/48.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්, එස්. එස්. විජේසිංහ මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු හෝ තව දුරටත් නියෝගයක් කරන තුරු හෝ 1965 නොවැම්බර 12 වැනි දින සිට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම් වශයෙන් වැඩ බැලීමට, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහකාර ලේකම් එස්. එන්. සෙනෙවිරත්න මහතා අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පත් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කායාලය,
කොළඹ, 1965 නොවැම්බර 10.
11-568

## ආණ්ඩුවේ නිවේදන

එල්.බී.—බී. 23/63

**1963 අංක 11 දරන මුදල් පනත**

58 (4) (ල) වන වගන්තිය යටතේ වූ ආඥාව යි

1963 අංක 11 දරන මුදල් පනතේ 58 වන වගන්තියෙහි (4) (ල) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම, මෙහි උපලේඛනයෙහි දක්වා ඇති වර්ගයෙන් හෝ විස්තරයෙන් යුත් දේපල ඉහත කී වගන්තියේ අංක (1), (2) හා (3) දරන උපවගන්තිවල කාර්‍යයන් සඳහා මෙයින් ආඥාවෙන් නියම කරමි.

සු. බ. වන්නිනායක,
මුදල් ඇමති.

1965 නොවැම්බර මස 11 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. හැම්බර්ග් හි ජී. ඇම්. බී. එච්. මාජරින්-යූනියන් වෙත පවරනු ලැබීමට නියමිත වූ ද සී. ඒ. නීල් මහතාට සීමාසහිත සී ව් සමාගමේ තත් කාලයෙහි හිමි ව ඇත්තා වූ ද රු. 10.00 යේ කොටස.

2. හැම්බර්ග් හි ජී. එම්. බී. එච්. මාජරින්-යූනියන් වෙත පවරනු ලැබීමට නියමිත වූ ද ජේ. සී. බර්නෙල් මහතාට සීමාසහිත සී ව් සමාගමේ තත් කාලයෙහි හිමි ව ඇත්තා වූ ද රු. 10.00 යේ කොටස.

3. හැම්බර්ග් හි ජී. එම්. බී. එච්. සී ව් ඉම්පෝර්ට් සහ සමාගම වෙත පවරනු ලැබීමට නියමිත වූ ද කොලොන් හි ඩොයිස්ච ජෙසල්ෂාෆ්ට් පියර් වියට්ෂාෆ්ලිජේ සුසමන්ආබයිට් (එන්වික්ලුම හෙල්ෂාෆ්ට්) එම්. බී. එච්. සහ සමාගමට හිමි ව සීමාසහිත සී ව් සමාගමේ තත් කාලයෙහි ඇත්තා වූ ද එකක් රු. 10.00 ක් වන කොටස් 228,875.

11-570


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1585——ආර් 10113—6,775 (65/11)